
# 6. ලස්සන අත්දැකීමක්

ඊයේ අපේ පාසලේ සිහිනි අවුරුදු උත්සවය පැවැත්වුණා. හැමෝ ම ලස්සනට ඇඳුම් ඇඳලා එයට සහභාගි වුණා.

දෙවැනි ශ්‍රේණියේ නංගිලා මල්ලිලා විවිධ ජාතික ඇඳුම්වලින් සැරසී සිටියා. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි ජාතීන්ගෙ ඇඳුම්වලින් සැරසුණු නංගිලා මල්ලිලා හරි ම ලස්සනයි.

අපේ පල්ලියේ පියතුමා, ගමේ පන්සලේ ස්වාමින් වහන්සේ, මුස්ලිම් පල්ලියේ පූජකතුමා, හින්දු කෝවිලේ පූජකතුමා අමුත්තන් හැටියට පැමිණියා.



විදුහල්පතිතුමා මෙම ආරාධිත අමුත්තන් කැඳවාගෙන ආවා.

සියලු දෙනා ම අසුන්වලින් නැගිට එතුමන්ලාට ආචාර කළා. එතුමන්ලා ද අපට ආශිර්වාද කළා.

ආගමික නායක උතුමන්ලා ද විදුහල්පතිතුමා ද අපේ ගුරුතුමිය ද පොල් තෙල් පහන පත්තු කළා. කසුන් සහ චමිපි අපේ පන්තිය වෙනුවෙන් පහන පත්තු කළා.

ඉන්පසු අවුරුදු උත්සවය පැවැත් වුණා. අපි සෙල්ලම් කළා තරගවලට ඉදිරිපත් වුණා. රබන් පද කිවුවා. රබන් ගැසුවා. ඔන්චිලි වාරම් කිවුවා. සැමදෙනා ම සතුට ට පත්වුණා.

උත්සවය අවසානයේ දී පියතුමා අපට තෑගි බෙදා දුන්නා.


අපේ විදුහල්පතිතුමා ඉන් පසුව ලස්සන කතාවක් කළා.

ඒ කතාව අපට හොඳට මතකයි.

"අද හරි හොඳ දවසක්. අපගේ අවුරුදු උත්සවයට ආගමි නායක උතුමන්ලා රාශියක් ආවා. අපේ පොඩි දරුවෝ ඒ උතුමන්ලා ආදරයෙන් පිළිගත්තා. එතුමන්ලා ද අපට ආශිර්වාද කළා.

මේ දරුවෝ සතුටෙන් සෙල්ලම් කළා. කෑම බීම බෙදා ගත්තා. ගුරුවරුන්ට බුලත් දී වැන්දා.

මේ වාගේ උතුම් දවසක් අපට ලබා දුන් දෙවි පියාට ස්තුති කරමු"



විදුහල්පතිතුමාගේ කතාවට පසුව අප සැම දෙනා ම සිරුවෙන් සිට ජාතික ගීය ගැයුවා. උත්සවය අවසාන වුණා.

## පැවරුම්

1. වරහන් තුළ ඇති වචනවලින් නිවැරදි වචන හිස්තැන්වලට යොදා අභ්‍යාස පොතේ ලියන්න.
(පල්ලියට, පන්සලට, කෝවිලට, මුස්ලිම් පල්ලියට)

1. කතෝලික අය ...................... යනවා.
2. බෞද්ධ අය ...................... යනවා.
3. මුස්ලිම් අය ...................... යනවා.
4. හින්දු අය ...................... යනවා.